# fiverr

# Freelancing

# සිංහලෙන්

# පටුන


01 Fiverr හැදින්වීම

02 Account එකක් සෑදීම හා නීති

03 හොද Gig එකක් සෑදීම

04 First Oder එක ගන්නා ආකාරය

05 සල්ලි ගන්නා ආකාරය


## වැදගත් කරුණු හා Tricks


01 Get You First Oder Asap

02 On Page Seo For Gig

03 Make Trustworthy Client

04 Increase You Conversion Rate

05 Stay Online

06 Become A Higher Level Sellers

07 Promote Your Gigs In Social Media


SMB

# තමන්ගේ හැකියාව Online විකුණන Fiverr

මෙය ගැලපෙන්නේ කාටද?

- කුමක් හෝ අලෙවි කල හැකි හැකියාවක් සහිත ඕනම කෙනෙකුට

මෙහි ආදායම කොහොමද?

- අනුමාන කිරීමක් කල නොහැක. මහන්සි වෙන විදියට සහා තමන්ගේ Quality එක මත මුදල තීරණය වේ. හොඳින් Quality වැඩ කරනවා නම් දවසට පැය 08ක් වගෙ උනන්දුවෙන් මහන්සි වෙනවා නම් මාසෙකට ලක්ශ 1-2 අතර උපයාගත හැක.
- ලක්ශ 10ට වඩා උපයන ඉතා විශාල ප්‍රමාණයක් ඇත.
- ලංකාවේ බහුලවම සිදුවන Part-time Online රැකියාවයි.

## Fiverr යනු කුමක්ද?

ගොඩක් අය දන්නවා වගේම Fiverr කියන්නේ ලෝකේ තියන ලොකුම Freelancing website එක. මොකක්ද මේ Freelance කියන්නේ? ඒ කියන්නේ ඔයා කෙනෙක්ගේ යටතේ නැතුව වෙනම ව්‍යාපරයක් කරන්නෙත් නැතුව ඔයාගේ සේවාව ආදල අයට ලබාදෙනවා කියන එක. ඉතින් Fiverr එකෙන් කරන්නෙ Freelance කරන අයව සහ සේවාවල් අවශ්‍යා අයව එකිනෙකා හා සම්බන්ධ කරලා දීමයි. එතකොට මොනවද අපිට මේකේ කරන්න පුලුවන් දේවල්. ගොඩක් අය හදාගෙන තියනවා මතයක් මේක කරන්න පුලුවන් Graphic Design විතරයි කියලා. Fiverr හී වඩාත්ම Trending Category එක Graphic Design වුණත් එහි ඕනම හැකියාවක් විකිණිය හැකි. ඉතාමත් සරල උදාහරණයක් මම මේකට ඔබට ලබාදෙන්නම්.

අපි දන්නවා වෙන රටවල් වල කට්ටිය ආදර සම්බන්ධතා තියාගෙන ඉඳලා වෙන් වුණාට පස්සේ අනිත් කෙනාට එක එක විහිලු එහෙමත් නැත්තම් Pranks කරනවා, එක එක නෝන්ඩි දානවා වගේ දේවල් කරනවා. ඉතින් අපේ රටේ කෙනෙක් ඉන්නවා මේවාට Videos කරලා දෙන. එයා කරන්නේ අදාල කෙනාගෙන් Order එක ගන්නවා එයාට අවශ්‍යා කෙනාගේ නම එක්ක. Video එක විදියට කරන්නේ කොලේක ඒ නම ලියලා කැලයක් මැද්දෙන් ඇවිදන් ගිහින් වලක් කපලා ඒ වලට අර නම ලිව්ව කොලේ දාලා වහනවා. විනාඩි 2-3 වගේ යන පොඩි Videos. බලන්න ඒක කොච්චර Creative Idea එකක්ද? මේ වෙද්දි එයා 5000$ වලට වඩා ඒකෙන් හොයලා තියෙනවා. ඉතින් ඔයාලා

Freelance කරන්න හැකියාවක් නෑ කියලා හිතලා ඔක්කොම අතැරලා දාලා නම් ඉන්නේ ඒකෙන් දෙයක් ගන්න බලන්න. ඉන්දියාවේ ඇදුම් මහන අය පවා Fiverr කරනවා. එයාලා වෙන රටවල අයට අවශ්‍ය Customized ඇදුම් Embroidery වගේ එව්වා කරලා එයාලට යවනවා. ඉතින් Computer එකෙන්ම කරන්න පුලුවන් දෙයක් ඕනෙ නෑ Fiverr හරහා Freelance කරන්න.

හරි අපි යමු කතාවට. ඔයා විකුණන්න යොදා ගන්න හැකියාව තීරණය කිරීම ඔයා සතු වගකීමක්. මම ඔයාලට දැනගන්න ගොඩක්ම Trending වගේම වැඩ එන Fields ටික පහලින් දන්නම්

- Graphic Design - Logo Design / Flyer design / Album Design ඇතුළු සියලුම Graphic වැඩ
- Content Writing in English
- Translations
- Web designing and software Engineering
- Circuit Board Designing
- 3D Modeling and Architecture

ඔය උඩින් දාලා තියෙන්නේ ලංකාවෙ අය ගොඩක්ම කරන කිහිපයක් විතරයි. මේ වගෙ එකී මෙකී නොකී සැහෙන්න දේවල් තියෙනවා මේ වෙබ් අඩවියේ කරන්න පුලුවන්. ඔයාට මොකක්ම හරි හැකියාවක් තියනවා නම් විනාඩියක් වත් හිතන්න එපා කෙලින්ම යන්න Fiverr.com එකට, ගිහින් ඒකේ Search Bar එකේ ඔයාගෙ හැකියාව ගහලා මම කියනවාට බලන්න කීදෙනෙක් ඒ හැකියාවෙන් හම්බකරනවද කියලා. ඉතින් මම හිතනවා මේ Fiverr කියන්නේ මොක්කද කියලා ඔයා තෙරුම් ගන්න ඇති කියලා. Fiverr වගේම තව Freelancer / Upwork කියලත් මේ වැඩේම වෙන වෙබ් අඩවි තියනවා. මේ හැම එකකම වෙන්නෙ එකම දේ නිසාත් වැඩියෙන්ම භාවිත වෙන්නේ Fiverr නිසාත් මම පියවරෙන් පියවර Fiverr එකේ ඉදිරියට යන ආකාරය කියලා දෙන්නම්.

## Fiverr Account එකක් සෑදීම සහා නීති මාලාව

ඇත්තටම මේකෙත් Account එකක් හදන එක නම් හරිම සරල වැඩක්. සාමාන්‍ය විදියට නම ගම විස්තර දාලා Account එකක් හදාගන්න තමයි තියෙන්නෙ. මෙයාලා බැංකු ගිණුම් විස්තර මුකුත්ම ඔයාගෙන් ඉල්ලන්නේ නෑ. මේකේ ඔක්කොම වෙන්නේ Account එක හදාගත්තට පස්සේ. මතක තියාගන්න කවදාවත් එකම Lap එකක හෝ ජංගම දුරකතනයක Fiverr ගිණුම් දෙකක් තියාගන්න එපා මොකද එහෙම වුණොත් ඒ ගිණුම් දෙකම නැති වෙන්න ඉඩ තියෙනවා. Fiverr කියන්නේ ටිකක් නීති තද වෙබ් අඩවියක්. මේක හදද්දී ඔයා ඔයාගෙම රූපයක් හරි Logo එකක් හරි අනිවාර්යෙන්ම Profile Photo එකට දාගන්න. හිස් තියන්නවත් වෙන විකාරවත් දාන්න යන්න එපා එහෙම උනොත් ඔයාගෙ ගිණුම එයාල අයින් කරන්න ඉඩ තියෙනවා. ඊළඟට කරන්න ඕන දේ තමයි GIG එකක් නිමර්‍ණය කරන එක. මොකක්ද මේ GIG එකක් කියන්නේ. මම කිව්වා වගේම Fiverr එකේ ඔයාට විවිධ හැකියාවන් දෙකක් තියෙනවා නම් ඒ දෙකම වුණත් කරන්න පුලුවන්. ඒක නිසා තමයි මම කිව්වේ මෙයාලා Account එක හදද්දී ඔයාගෙන් විස්තර මුකුත් ගන්නේ නෑ ඒවාට අදාලව. මොකද Account එක හැදුවට පස්සේ ඇතුලෙන් තමයි හැමදේම තීරණය කරන්නේ. එතකොට GIG එකක් කියන්නේ ඔයාගෙ හැකියාව ප්‍රදශර්නය කරන Showcase එකක් වගේ එකක්. ඔයා ගිග් එකක් හදනවා කියලා කරන්නේ ඔයාගෙ හැකියාව ගැන නමක් විස්තරයක් එක්ක ෆොටෝ කිහිපයක් එකතු කරලා පොඩි Sub Profile එකක් වගේ එකක් හදන එක. මේ වගේ ඔයාට තියන හැම හැකියාවටම වෙනමම GIG එකක් හදාගන්න පුලුවන්. උදාහරණයක් ලෙස කියනවා නම් කෙනෙක් Logo එකක් Design කරගන්න ඕන

## [ Account එක හදන්න කලින් දැනගන්න ]

මුලින්ම ඔයා කරන්න ඕනෑ fiverr එකෙ ඔයා මොනවද කරන්න ඕනෑ කියල plan කරන එක.එකට ඔයා දක්ශ වගේම ආස වෙන්නත් ඕනෙ.

ඊලගට ඔයා account එකෙ user name එකක් දාන්න short creative වගේම ඔයාගෙ service එකට ගැලපෙන හදාගන්න.

මෙ වැඩෙට ඔයාගෙ පරන email එක use කරන්නේ නැතිව අලුත් e-mail එකක් හදාගන්න. ඔයා හදපු username එකම use කරල එක account එකක් විතරක් හදන්න.එ වගේම ip.country වෙනස් කරල account හදන්න යන්න එපා.විවිධ internet connection පාවිච්චි කරල log වෙනන යන්නත් එපා.එක පාරම හොදට හිතල බලල account එක හදන්න.

account එක හදන එක ලේසි වැඩක් එ උනාට මන් අර කලින් කිව්ව දෙවල් ගැන සැලකීමක් වෙන්න.එතකොට තමයි account එකේ තියෙන quality එක වැඩි වෙන්න.

## [දැන් බලමු නිවරදිව fiverr account එකක් හදාගන්න හැටි]

ඔයාලට පුලුවන් WWW.FIVERR.COM කියන site එකට ගිහින් උඩම තියෙන join කියන  එක හරහා account එක create කරගන්න.



join එක click කරහම වහල තියෙන  box එක open වෙනවා.එකට කලින් හදාගත්ත email එක දීල continue click කරන්න.



දැන් තව box එකක් open වෙනවා එකට කලින් හිතපු username එක දීල strong password එකකුත් දීල join button එක click කරන්න.




දැන් ඔයා sign වෙන්න use කරපු email එකට fiverr එකෙන් e-mail එකකුත් එවල ඇති ඒකෙ කොළ පාටින් තියෙන active you account එක click කරන්න.

දැන් ඔයා එක හරහා එන්නේ ඔයා log වෙලා ඉන්න fiverr එකටම තමා.
දැන් ඔයාගෙ account එක active successfully කියල කොල පාට bar එකින් පෙන්නනවා.







දැන් කොල පාට bar එකේ තියෙන edite you profile කියන එක click කරන්න.
ඊලගට එන page එකෙ ඔයාගෙ සම්පූර්න නම දාල save click කරන්න.




ඊලගට ඔයාගෙ account එකේ ඉතිරිවැඩ ටික කරගන්න දකුණු පැත්තේ ඔයාගෙ user account එක පෙන්නන circle එකට ගිහින් settings වලට යන්න. ඊට පස්සේ ඒකෙ billing information වලට යන්න. දැන් මෙ details ටික fill කරල saves changes click කරන්න .






ඊලගට අපෙ seller profile එක හදාගන්න ඕනෑ. fiverr එකෙ සාර්ථක වෙන්න ඕනෑ නම් මෙක වැදගත්.එ නිසා එකට හොද අවදානයක් යොමු කරන්න ඕනෙ

දැන් දකුණු පැත්තේ ඔයාගෙ cricle එකට ගිහිල්ල profile වලට යන්න.

දැන් අපි ඕකෙ කොටස් වෙන වෙනම කතා කරමු.




1 A profile pic (A) මෙ photo එකෙ අපෙන් service එකක් ගන්න එන කෙනෙක් මුලින්ම දකින්න මෙය නිසා මෙ photo එක අපෙ service එකට ගැලපෙන විදිහටත් creative විදිහටත් දාන්න ඕනෑ.

2 B මේ කොටසට (B) අපි මොනවද service එක විදිහට දාන්නෙ කියල.




3 description මෙ කොටසට ඔයා ගැන විස්තරයක් කියන්න.එකෙන් ඔයා කවුද මොනවද කරන්නේ සුදුසුකම් ඔයාට කොච්චර අත්දැකීම් තියෙනවද මෙ service එකට ?service එකෙ තියෙන විශේෂත්වය. මෙන්න මෙ වගේ දේවල් ඔයා පැහැදිලිව සදහන් කරන්න.




4 language. මෙතන .English කියන තැන තමාගෙ නිපුණතාව අනුවbasic සාමාන්‍ය කතා කරන්න පුළුවන් දේවල්

language එකකුත් පුළුවන්නම් add new එක හරහා add කරගන්න. language එකකුත් පුළුවන් කියන්නේ ඒක අමතර වාසියක් Russian. france.italy අයගෙන් oder ගන්න.




5 test taken මෙක ඔයාලගේ skrill එක test කරන්න දාලා තියෙන්නෙ.මෙ කරන දෙයින් ඔයාට වැඩි විශ්වාසයක් දිනාගන්න පුළුවන් වගේම service ගන්න අයට ඔයාව මනින්න පුළුවන් මිම්මක්.
එ නිසා මෙක test  කරන්න අමතක කරන්න එපා. මේකෙ basic test එකක හැමෝටම දාල තියෙනවා. එ වගේම ඔයාලගේ service  එකට ගැලපෙන  test තෝරගෙන කරන්න.







6 linking account. මෙ කොටස හරහා ඔයාට පුළුවන් ඔයාගෙ FACEBOOK.GOOGLE හරහා ඔයාගෙ වැඩි විස්තර පෙන්නන්න පුළුවන්.




7 skrill .education. certificate මෙ කොටස් ටික තියෙන්නෙ ඔයාගෙ skrill හැකියාවන්. අධ්‍යාපන සුදුසුකම්.සහතික ඉදිරිපත් කරන්න. මෙ හරහාද ඔබටවැඩි විශ්වාසයක් දිනාගන්න පුළුවන්

[දැන් අපි සාර්ථකව FIVERR ACCOUNT එකක් CREATE කරගත්තා]

---

දැන් අපි බලමු FIVERR එකෙ තියෙන LEVELS මොනවාද කියල.
LEVEL 4 තියෙනවා

1 SELLER
2 LEVEL ONE SELLER
3 LEVEL TWO SELLER
4 TOP RATED SELLER

(1) ඔයා FIVERR එකට ගිහින් මුලින්ම GIG එකක් හැදුවට පස්සෙ NEW SELLER විදිහට තමා RESPONSE වෙන්නෙ.මෙතනින් පස්සෙ ඔයා වැඩ කරන විදිහට අනුව තමයි LEVEL UP වෙන්නෙ.

BENEFITS - [ACTIVE GIGS 7..GIGS EXTRA 2 ($5. $10. $20)..GIG MULTIPLES 5..ඩොලර් 5000 දක්වා COSTOM OFFERS යවන්න පුළුවන්.. ..එන සල්ලි දවස් 4න් CLEAR වෙනවා.]

(2) LEVEL ONE SELLER - මේකට ඔයා මූලික දේවල් කිහිපයක් සම්පූර්න කරන්න ඕනෑ.අන්තිම දවස් 60 FIVERR එක ඔයාගෙ ACCOUNT එක REVIEW කරල බලනකොට ඔයාගෙ PERFORMANCE හොදනම් FIVERR එක ඔයාව LEVEL UP කරනවා.මෙකට ඔයා SELLER කෙනෙක් විදිහට දවස් 60 COMPLETE කිරීම.දින 60ක් තුල අවම 4.7 STAR RATING එකක් තිබීම.සම්පූර්න ODER 10 COMPLETE කිරීම.400$ EARNINGS එකක් තිබීම.දින 60 ක් තුළ 90% RESPONSE කිරීම.90%ක WARNING නොකළ තිබීම.

BENEFITS - ACTIVE GIGS 10
GIG EXTRA 4 (5$.20$.40$)
GIG MULTIPLES 10
ඩොලර 5000 දක්වා COSTOM OFFER යවන්න පුළුවන්.
එන සල්ලි දවස 14න CLEAR වෙනවා.
PROMOTION කරන්න පුලුවන් .

(3) LEVEL TWO SELLER - මෙකට ඔයා SELLER කෙනෙක් විදිහට දවස් 120ක COMPLETE කිරීම..සම්පූර්ණ ODERS 50ක COMPLETE කිරීම..2000$ වත් EARNINGS එකක් තිබීම.

දින 60 තුළ අවම 4.75 STAR RATINGS එකක් තිබීම..දින 60ක් තුළ 90% ක RESPONSE එකක් තිබීම..90% ODERS COMPLETE කිරීම..90% ON TIME DELIVERY කිරීම හා දවස් 30 ක කාලයකදී WARNING කර නොතිබීම වැදගත්ය.

BENEFITS - ACTIVE GIGS 20
GIG EXTRA 5 (10$.20$.50$)
GIG MULTIPLES 15
ඩොලර් 10000 දක්වා COSTOM OFFER යවන්න පුලුවන්
එන සල්ලි දවස් 14 න් CLEAR වෙනවා
PROMOTION කරන්න පුලුවන්
COSTOM SUPPORT එක වැඩි වෙනවා

(4) TOP RATED SELLER - මෙකෙට ඔයා SELLER කෙනෙක් විදිහට දවස් 180 ක් COMPLETE කිරීම..සම්පූර්න ODERS 100 COMPLETE කිරීම..2000$ වත් EARNINGS එකක් තිබීම..දින 60 තුළ අවම 4.7 STAR RATING එකක් තිබීම..දින 60 තුළ90% RESPONSE කිරීම.90% ODERS COMPLETE කිරීම..90% ON TIME DELIVER කිරීම හා දවස් 30 කාලයේ WARNING නොකළ තිබීම වැදගත් කරුණකි.

BENEFITS - ACTIVE GIGS 30
GIG EXTRA 6 ($5. $10. $20. $100)
GIG MULTIPLES 20
ඩොලර් 10000 දක්වා COSTOM ODER යවන්න පුළුවන
එන සල්ලි දවස් 7 න් CLEAR වෙනවා
PROMOTION කරන්න පුළුවන්
VIP CUSTOMER SUPPORT




-හරි දැන් අපි LEVELL ගැන දැනගත්තා-

අපි ඊලග පිටුවෙන් බලමු STEP BY STEP GIG එකක් CREATE කරන ආකාරය
>>>>>>>>>>

[හොදයි දැන් බලමු STEP BY STEP GIG එකක හදන ආකාරය]

GIG එක හදන්න කලින් මේ ටිකත් දැනගන්න අපේ සුපිරි GIG එකක් හදන PAGES වලත් තියෙනව එ උනාට මෙ ටිකක් දැනගන්න.

1 මුලින්ම ඔයා හොයාගන්න ඕන වැඩියෙන් ඉල්ලුම් තියෙන GIGS මොනවද කියල.එකට ඔයා ~~FIVERR~~ එකේ තියෙන RATING GIGS මොනවද කියල SEARCH කරල බලන්න.එතකොට ඔයාට IDEAS එකක් ගන්න පුළුවන්.

2 හදන GIG එක තමාගෙම වෙන්න ඕනෙ.අනිත් අයගෙන් IDEAS අරන් ඔයම CREATIVE ආකාරයට GIG එක හදන්න.

3 GIG එකෙ QUALITY එක අනුව තමයි ඔයාට ඔODER එකක් එනවද නැද්ද කියල තීරණ වෙන්නෙ.එ නිසා හොදට වෙලාව අරගෙන කලබල නොවී GIG එක හදන්න.ඔයාට පැය 2-3 වගේ ඇතුළත DELIVER කරන්න පුළුවන් GIG එකක් දාන්න පුළුවන් නම් ගොඩක් හොදයි.

## නිවරදිව GIG එකක් හදමු

ඉස්සෙල්ල ඔයාගෙ FIVERR එකට LOG වෙලා දකුණු පැත්තේ SWITCH TO SELLER කියන එකට ගිහින් උඩම තියෙන GIGS කියන එකට යන්න.







දැන් OPEN වෙන PAGE එකෙ CREATE NEW GIG එක CLICK කරන්න.



…….දැන් බලමු ඊලගට අනුපිළිවෙල කරන දේ




(1) GIG TITLE -මෙතන ඔයා දෙන SERVICE එක ගැන TITLE එකක් දෙන්න ඕන .හැබැයි එ මුලු GIG එක ගැනම IDEAS  එකක්. ඒක SHORT & CLEAR එකක් වෙන්න ඕන.එ අපේ SERVICE එක දැක්ක ගමන් මොකක්ද කියල අවබෝධ වෙන්න.

(2) CATEGORY - GIG එකට අදාළ CATEGORY එක නිවැරදි කරන එක අනිවාර්යයෙන් වෙන්න ඕනෙ.එ වගෙම SUB CATEGORY එකත් නිවරදිව FILL කරන්න ඕනෙ.මෙකෙන් තමා ඔයාගෙ GIG එක නිවැරදිව පේන්නෙ එ නිසා මෙක ඔයාට ODERS එන එක තීරණය කරන දෙයක්.




(3) GIG METADATA- මෙකෙන් ඔයාගෙ GIG එක CREATE කරන STYLE එක සහ FINAL PRODUCTS එක DELIVER කරන FILE FORMAT එක තෝරන්න.

(4) SEARCH TAGS- FIVERR එකෙ SEARCH කරන BUYER ලට නිවරදිව GIG ලැබෙන්නේ මේ TAGS වලින්.ඒ නිසා TAGS දාද්දි කල්පනාකාරී වෙන්න ඕන.මොකද හරි TAGS තිබ්බොත් විතරයි හරි BUYER ගාවට GIG එක යන්නේ.මේකයි කරන්න තියෙන්නෙ ඔයා BUYER කියල හිතාගෙන ඔයා GIG එක SEARCH කරයි කියල හිතෙන වචනTAGSවිදිහට දාන්න. උපරිම TAGS 5ක් දාන්න පුලුවන් අවම 3යි.TAGS 5ම දාන්න පුලුවන් නම් හොදයි.

# ගදැන් SAVE AND CONTINUE කරන්න දැන් ඇවිල්ල ඉන්නෙ SCOPE & PRICING කියන කොටසට



**Compare Packages**

5

| Package | $15 Basic | $65 Standard | $115 Premium |
|---|---|---|---|
| | BASIC LOGO DESIGN<br>2 Basic Logos + Standard High Quality Mockup - NO COMPLEX OR MASCOT LOGO | RECOMMENDED - MOST SELLING PACKAGE<br>2 HQ UltraQuality Logos + AI EPS Vector Source File + 3D Mockup + VIP Support + 5 Social Media Cover | COMPLETE PACKAGE - PERFECT NEED 4 U<br>3 ULTIMATE Logos + AI - EPS PDF JPG PNG File + 3D Mock-up + 5 Social Media Cover + Statonery Design |
| Source File | ✓ (grey) | ✓ | ✓ |
| Logo Transparency | ✓ | ✓ | ✓ |
| High Resolution | ✓ | ✓ | ✓ |
| 3D Mockup | ✓ (grey) | ✓ | ✓ |
| Stationery Designs | ✓ (grey) | ✓ (grey) | ✓ |
| Social Media Kit | ✓ (grey) | ✓ | ✓ |
| My Vector File | ✓ (grey) | ✓ | ✓ |
| # of Initial Concepts Included | 2 | 2 | 3 |
| Revisions | 3 | 6 | Unlimited |
| Delivery Time | 3 days<br>1 day (+$30) | 1 day | 1 day |
| Total | $15<br>Select | $65<br>Select | $115<br>Select |

(5) SCOPE & PRICING - මෙ කොටසින් ඔයාගෙ GIG එක CATEGORIES 3 කට බෙදන්නට පුළුවන්.BASIC. STANDARD. PREMIUM කියල.මෙකෙදි ඔයාල කරන්න ඕන BASIC සිට PREMIUM දක්වා ඔයාගෙ GIG එකෙන් කරන SERVICE එකෙ QUALITY එක සහ ADDITIONAL FACILITIES එක වැඩි වෙන විදිහට.
උදාහරණයක් විදිහට BASIC සිට PREMIUM දක්වා DELIVERY TIME එක 12HR 24HR 36HR විදිහට දාන්න පුළුවන්.දැන් පුළුවන් වෙන්න ඕන තීරණය කරන්න අපේ SERVICE එකත් එක්ක මෙ තියෙන OPTIONS වලින් මොනවද අපි දෙන්නේ සහ නැත්තේ කියල.



ඔයාට අවශ්‍ය නම් පුළුවන් ADD EXTRA SERVICES හරහා සමහර OPTIONS අමතර මුදලක් අය කරල දෙන්න.හිතන්න අපි මොනවහරි ITEM එකක් CUSTOMER ලට SHIP කරනව කියල ඒකෙ SHIPPING FEE එක අපිට පුළුවන් මෙතන ADD කරන්න.

දැන් SAVE & CONTINUE කරගන්න දැන් අපි එන්නෙ DESCRIPTION & FAQ කියන කොටසට

(6) DESCRIPTION & FAQ - ඔයාගෙ DESCRIPTION එකෙන් තමා BUYER තීරණය කරන්නේ ඔයාට ODER එකක් දෙනවද නැද්ද කියල.ඒ නිසා ඔයා හොදටම මේ DESCRIPTION එක හදන්න ඕනෙ.එ නිසා මේ දේවල් ADD කරන්න DESCRIPTION එක හදනකොට.

(.මේ GIG එකෙන් කරන්නේ මොකක්ද
.ඔයාගෙ GIG එක කොහොමද අනිත් අයගේ GIG වලින් වෙනස් වෙන්නෙ
.BUYER ලට ලැබෙන වාසි
.ඔයාගෙ SERVICE එකෙ තියෙන QUALITY එක)

ඔයාට පුළුවන් GIG EXTRA ගැන එහෙමත් DESCRIPTION එකෙ දාන්න. කොහොම හරි වෙන්න ඕනෙ BUYERS ලට ඔයාගෙ SERVICE එක ගැන විශ්වාසයක් ඇතිවන එක මෙ DESCRIPTION එක හරහා

එකට ඔයා කරන්න ඕන ඔයාගෙ FIELD එකෙ පොරක් කියල පෙන්වන එක.ඒකට ඔයා ENGLISH හොදට USE කරන්න ඕන



**About This Gig** 6

**"Creating beautiful brand face, one at a time"**

**'We' 'Perfectionist'** is a highly talented and dedicated team, focused on providing unique logo design absolutely from scratch. A Logo is the face of your brand which is as equally important as the success of your business and we make sure to dig the pillars of your success from depth.

**Kindly select STANDARD or PREMIUM pack for best results similar to my portfolio.**

**Reasons that make our gig unique!**
✓Original, highly creative and conceptual design that clearly depict the brand's message
✓Swift, Reliable and Premium support
✓Unlimited Revisions(until you are satisfied)
✓Team of award-winning designers
✓All types of vector source files-AI EPS PDF PNG JPEG
✓and lot more

**Nothing Beats the Experience! Check out my live portfolio, Client's feedback and be assured**
Portfolio: https://flic.kr/s/aHskHuJvwS

Minimal Logo | Modern | Professional | Flat | Luxury | Text | Vintage | Badge | Feminine | Signature | Custom Design

FAQ කියන්නේ BUYERS ල වැඩිපුරම අහයි කියල හිතෙන ප්‍රශ්ණ කලින්ම අපි දාන එකට .මන් උදාහරණයක් කීපයක් දාල තියෙනවා බලන්න




DESCRIPTION සහ FAQ දෙකම COMPLETE කලානම් SAVE & CONTINUE දෙන්න
දැන් ඔයා එන්නේ REQUIREMENTS කියන කොටසට

(7) REQUIREMENTS - මෙක තියෙන්නෙ BUYER කෙනෙක් ඔයාගෙ GIG එක ODER කරහම එක COMPLETE කරන්න BUYER ගෙන් ඕන දේවල් හා දැනගන්නට ඕන දේවල් .මෙ REQUIREMENTS ගෙන් FREE TEXT. MULTIPLE ANSWERS.ATTACHMENT FILE ලෙසට ආකාර 3කින් ගන්න පුලුවන්




මෙම විදියට මේ දේවල් ADD කරල SAVE & CONTINUE දෙන්න පුළුවන් .දැන් අපි එන්නේ GALLERY කියන කොටසට



(8) GALLERY - මෙ කොටසත් ඉතාම වැදගත් කොටසක්.මේකෙ ප්‍රධාන කොටස් 3 ක් තියෙනවා.GIG PHOTOS. GIG VIDEO. GIG PDF කියල.ඔයාගෙ GIG එකට පෙනුම එන්නේ GALLERY කියන කොටසින්.අපිට BUYERS ALTRACK කරගන්න ඕන නම් මෙ කොටස ටික ලස්සනට පිලිවෙලට දාන්න ඕන.

ඒකෙනුත් GIG PHOTOS වලට ප්‍රධාන තැනක් එනවා.ඔයාට පුළුවන් GIG PHOTOS 3K දාන්න.මෙ PHOTO වලින් ඔයාගෙ SERVICE එක හොදට කැපිල පේන්න ඕන. ඒ වගේම HIGH QUALITY PHOTOS දාන්න ඕනෙ.මෙ දාන PHOTOS වල RESOLUTIONS එක අවම 550PIXEL - 370PIXEL (WIDTH HEIGHT ) වෙන්න ඕනෙ.ඒක වැඩි වෙන තරමට හොදයි.ඒ වගේම PHOTOS වල FORMAT එක JPEG JPG PNG වලින් තියෙන්න ඕන.



ඊලග කොටස තමයි  GIG VIDEO එක.මේකෙන් පුළුවන් ඔයාගෙ GIG එකට BUYER S  ල එන එක 40% වැඩි කරගන්න.මොකද PHOTOS කිහිපයකට වඩා VIDEO එකකින් සම්පූර්ණ විස්තරයක් BUYRRS ලට දෙන්න පුළුවන් නිසා.ඒ නිසා මහන්සිවෙලා CREATIVE විදිහට ඒ වගේම HIGH QUALITY VIDEO එකක් හදන්න.මේ VIDEO එක තප්පර 70 කට සහ 50MB වලට නොවැඩි විදිහට හදන්න.




ඊලගට ඔයාල මේ GIG එක ගැන නම තියෙන DETAILS PDF .එකක් විදිහට දෙන්න පුළුවන් .ඒ වගේම මතක තියාගන්න PDF එකේ QUALITY එකත් ඔයාලට ODERS එන්න බලපානවා.

මේ දේවල් ටික ඔක්කොම කලානම් මෙන්න මෙ එකට එකක් දාන්න.එතනින් කියවන්නෙ ඔයා මෙ UPLOAD කරපු දේවල් ඔයාම CREATE කරපු දේවල් කියල CONFIRM කරනව කියල සහ වෙන කෙනෙක් ගෙන් COPY කරල කියල හිතන නිසා.ඒ නිසා ඔයාම CREATE කරපු දේවල් විතරක් දාන්න.




දැන් SAVE & CONTINUE දෙන්න
දැන් ඉතින් GIG එක හදල ඉවරයි.දැන් තියෙන්නෙ GIG එක PUBLISH කරන්න ඒක PUBLISH GIG එක හරහා කරන්න පුළුවන්.



හරි අපි අපේ GIG එක සාර්ථකව PUBLISH කලා.දැන් අපි බලමු අපේ GIG එක PUBLISH කලාට පසුව තියෙන්නට පුළුවන් GIG STATUS මොනවද කියල.

. ACTIVE - මේ GIGS FIVERR එකේ BUYERS ලට BAY කරන්න පූලුවන් විදියට තියෙනවා

.PENDING APPROVAL- මේ කියන්නේ මේ GIG එක FIVERR එකේ APPROVAL වෙනකම්ම තියනවා කියන එක බොහෝ වෙලාවට මෙහෙම වෙන්නෙ ඔය GIG එකට VIDEO එකත් UPLOAD කරල තියෙනවනම්

.DRAFT-හදල දැනට PUBLISH කරල නැති ඒවා

ඔබේ GIG එක RANKING වල උඩටම ගමු

ඇත්තටම GIG එකක් හදල PUBLISH කලා කියල දවසින් දෙකින්  අපිට ODERS හම්බෙන්නෙ නෑ.ඒකට අපි ටිකක් මොලේ පාවිච්චියට ගන්න ඕන.

IMPRESSION.CLICKS.VIEWS.ODERS. POSITIVE REVIEWS නැතුව අපිට ODERS ගන්න අමාරුයි.ඒකට කරන්න තියෙන්නේ මේ දේවල් අපිම අපේ එකට අරන් දෙන එක.ඒකට ඔයාට පුළුවන් DUMMY FIVVER ACCOUNT එකක් CREATE කරගෙන ඔයාගෙ GIG එක දෙපාරක් BUY කරන්න. ඊට පස්සේ හොද POSITIVE REVIEW දෙකක් දෙන්න පුළුවන් ඔයාගෙ GIG එකට.

ODERS එක නිවරදිව DELIVERS කරමු

BUYER කෙනෙක්ගෙන් ඔයාට ODER එකක් ආවාම EMAIL ඒක දැනුම් දෙනවා.ඒ වගේම ODER එක FIVERR එකෙනුත් බලාගන්න පුළුවන්.




BUYER ODER එක දාල ODER REQUIREMENTS SUBMIT කරාට පස්සෙ ODER එක DELIVERS කරන්න තියෙන වෙලාව COUNTDOWN වෙන්න පටන් ගන්නවා. ඔයා ඉවර වෙනකම් ඉන්න එපා.පුළුවන් තරම් ඉක්මනින් ODER එක DELIVERS කරන්න .




මුලින් ඔයාල කරන්න ඕනේ BUYER එවපු DETAILS හොදට කියවන එක.ඊට පස්සේ ඒ DERAILS වලින් ඔයාට පුළුවන් BUYER ට MESSAGE එකක් අමතර DETAILS ඉකමණට ඉල්ලා ගන්න. මොකද හොද ODER එකක් DELIVERS කරන්න BUYER ගෙ REQUIREMENTS හොදට අවබෝධ කරගන්න ඕන.

BUYERS කියපු විදියට ODER එක COMPLETE කරල DELIVERS NOW කියන එක හරහා BUYER ට ODER එක යවන්න.ඊට පස්සෙ ඔයා හොදට SERVICE එක දුන්නාම BUYER ට කියන්න ඔයාට 5 STAR RATING එකක් එක්ක හොද FEEDBACK එකක් දෙන්න කියල.

වෙලා Fiverr එකට ඇවිල්ලා Logo Designing කියලා Search කළොත් එයාට ප්‍රතිඵල විදියට පෙන්නන්නේ Logo Designers ලා දාපු GIGS. ඉතින් තනිකරම ඒකේ Quality එකෙන් තමයි එන කෙනා ඔයාගෙ Quality එක තීරණය කරගන්නේ.

## සුපිරිම GIG එකක් නිර්මාණය කරගන්නේ කෙසේද?

මේක මම උදාහරණයක් ලෙස ලියලා දෙන්නම්. මේක ඔයා කරන ඕනම ක්ෂේත්‍රයකට අදාලයි. අපි උදාහරණයට ගමු ඔයා Logo Design කරන්න හැකියාවක් තියෙන කෙනෙක් කියලා .දැන් ඔයා GIG එක හදන්නයි යන්නේ. ඒත් ඔයා වගේම Logo හදන අය දහස් ගාණක් මේකේ ඉන්නවා. එතකොට කෙනෙක් ඇවිල්ලා Logo Designer කියලා ගැහුවම Search Results දහස් ගාණක් එනවා. එතකොට අපි කොහොමද අපේ GIG එක උඩට එන විදියට හදන්නේ. අපි කියනවා මේකට GIG Ranking කියලා. දැන් මම කියලා දෙන්න යන්නේ මේක කරන විදිය පියවර කිහිපයකින්. මුලින්ම ඔයාලට Word or Excel හිස් පිටුවක් ගන්න වෙනවා. මම Logo Design උදාහරණෙන් මේක කිව්වට මේක ඕනම එකකට පොදුයි. ඒක නිසා අනිවාර්යයෙන්ම හොඳින් තේරුම් ගන්න.

ඔයාගේ Account එකේ Buyer Mode එක On කරගන්න පල්ලේහා රූපයේ පෙන්නලා තියන විදියට.




දැන් ඔයා සේවා සපයන්නෙක් නෙවෙයි සේවා මිලදී ගන්න කෙනෙක් විදියටයි ඉන්නේ. දැන් අපි කරන්නේ මේකේ Search කරන තැන ගහනවා Logo Design කියලා. එතකොට අපිට එනවා Fiverr එකෙ පලවෙනි පිටුවේ ඉන්න Logo Designers ලගේ GIGs. ඉතින් දැන් අපිටත් ඕනේ මේ වගේ අපේ GIG එකත් උඩට ගන්න. එහෙනම් අපි කරන්න ඕන

දේ තමයි මේ උඩම තියන ගිග් වල තියන Key Words මොනවද, ඇයි මේවා උඩට ඇවිල්ලා තියෙන්නේ කියන එක තේරුම් ගන්න.

ඔයා දැන් උඩම තියන GIG 10 වෙන වෙනම Open කරන ගමන් ඒවායේ තියන මාතෘකාවයි විස්තරේට තියෙන ටිකයි Copy කරලා ගෙනල්ලා කලින් Open කරගත්ත Word Document එකේ Paste කරන්න. දැන් මේක හොඳම ගිග් 10ට 15ට වගේ කරාම ඔයාගෙ Word Document එකේ හොඳ දත්ත ටිකක් එකතු වෙලා තියනවා. දැන් ඔයා මාතෘකා ටික අරගෙන ඒ හැම එකේම තියන පොදු වචන ටික පොඩ්ඩක් වෙනම පොතක් අරන් ලියාගන්න. පොදු වචන කියන්නේ හැම එකේම තියෙන්න ඕනෙ කියන එක නෙවෙයි වැඩියෙන් යෙදිලා තියන වචන මොනවද කියන එක වෙන් කරගන්න. ඔය විදියටම ඔයා එකතු කරගත්ත විස්තර වලත් වැඩියෙන් එයාලා දාලා තියෙන වාක්‍ය සහ වචන මොනවද කියන එක බලාගෙන පොතක හොඳ Note එකක් දාගන්න. දැන් ඔයාට තියෙනවා ඔයාට අදාල Category එකේ GIG එකක් හදද්දි අවශ්‍යම වෙන වචන ටික. මේ වැඩේ කරන්න සමහර විට ඔයාට දවසක් විතර යන්න ඉඩ තියනවා මොකද පරිස්සමට උවමනාවෙන් කරන තරමට වචන හම්බවෙනවා වැඩි. අපි මේ වචන වලට කියනවා Key Words කියලා. ඔයාලට මේ ක්‍රමේට Keywords හොයන්න අමාරුයි වගේ නම් Google Chrome වල තියනවා wordtracker Scout කියලා Plugin එකක්. සාමාන්‍යයෙන් Google එකට ගිහින් ඒ නම Type කරලා මේක ඔයාට Install කරගන්න පුලුවන්. ඊට පස්සේ ඔයාට අවශ්‍ය ඕනම පිටුවකට ගිහින් මේ Plug in එක Run කර විට එම පිටුවට අදාල Keywords ඔයාලට බලාගන්න පුලුවන්. පහල රූප වල ඇති පියවර බලන්න.






ඇයි මේ Keywords වැදගත් වෙන්නේ කියනවා නම්, ඕනම වෙබ් අඩවියක් හදන්නේ Search කරාම වඩත්ම ගැලපෙන Keyword සහිත ඒවා උඩට එන විදියට. ඉතින් අපිට අවශ්‍ය Keywords ටික හොයාගත්තා කියන්නේ දැන් අපිටම හොඳ මාතෘකාවක් සහා විස්තරයක් හදාගන්න පුලුවන්. දැන් අර මාතෘකා වලින් අහු වුණ Keywords ටික දාලා අපිටම හොඳ එකක් හදාගන්න. කොයි වෙලාවකවත් වෙන කෙනෙක්ගේ Topic එකක් හොරකම් කරන්න එපා. ඊළඟට තියෙන්නේ විස්තරය හදාගන්න එක. මෙකේදි නම් ටිකක් හොඳට ඉංග්‍රීසි භාෂාව හසුරවගන්න ඕනෙ. ඔයාට කරන්න පුලුවන් අපි ඒකට හොයාගත්ත වාක්‍ය සහ Keywords ඇතුලත් වෙන විදියට වචන 1200ට අඩු හොඳ Description එකක් හදන එක. ඉංග්‍රීසි ගැටලු තියෙනවා නම් යාලුවෙක්ට හරි දීලා මේක හදාගන්න. දැන් ඔයාගෙ GIG එකට අවශ්‍ය වෙන ගොඩක් ශක්තිමත් Topic and Description එක ඔයාට හම්බවුණා. මේකෙන් ඔයාගෙ GIG එක සෑහෙන්න තරම් උඩට ගන්න ඉඩ තියෙනවා. දැන් ඔයා හදාගත්ත ටික වෙනම Word Document එකක Save කරගන්න. ඊළඟට අපිට GIG එක හදද්දී කියනවා Tags 05ක් දාන්න කියලා. ඒ Tags කියන්නෙත් කෙනෙක් Search කරද්දී එයාට අදාල ඒවා පෙන්නන Keywords වගේම දෙයක්. එතකොට ඔයාට ගැලපෙන Tags ටිකත් Fiverr එකෙන්ම හොයාගන්න පුලුවන්. අර කලින් වගේම Fiverr එකට ගිහින් Logo Design කියලා Search කරාම එයාලම Tags කිහිපයක් පෙන්නනවා. පහල රූපය බලන්නකෝ! අන්න එතනින් ඔයාට වඩාත්ම ගැලපෙන Tag 05ක් තීරණය කරලා අර අපේ අලුතෙන් හදාගත්ත Word Document එකේ Save කරගන්න.

මීළඟට අපිට අත්‍යාවශ්‍යම දේ තමයි ගිග් එකට දාන්න Photos. උඩ තියන වැඩ ඔක්කොම කරලා ඔයාගෙ ගිග් එක පලවෙනිම පිටුවේ උඩම එක වුණත් වැඩක් නෑ ඔයාගෙ වැඩ Quality නැත්තම්. වැඩ Quality වුණත් වැඩක් නෑ ඒ ටික ඔයාට පිළිවෙලට හදාගන්න බැරි නම්. ඉතින් ඔයාගේ වැඩේ Quality එක මට වෙනස් කරන්නට නොහැකි නිසා ඒ සඳහා ඕන කරන Photos හොඳට සකස් කරගන්න එක ඔයාට බාරයි. Fiverr එකෙන් අපිට රූප 3ක් දාන්න අවස්ථාව දෙනවා. පුලුවන් තරම් එක Image එකක ඔයාගෙ වැඩ 4ක් වත් ලස්සනට පේන්න දාන්න උත්සාහ කරන්න. එතකොට රූප 3ක් ඇතුලේ ඔයාට Samples 12ක් වගේ ගාණක් පෙන්නන්න පුලුවන් වෙනවා. ඒ වගේම ඕනවට වඩා එකක් ඇතුලට Sample දාන්න යන්නත් එපා එතකොට ඔයාගෙ Sample එක පැහැදිලි නැති වෙලා යන්න ඉඩ තියනවා. අනිත් එක තමයි මේ රූප වලට Meta Data එකතු කරන්න. ඒ කියන්නේ ඔයාලට පුලුවන් Adobe PS , Adobe AI වගේ මෘදුකාංග වලින් Photo එකක් Save කරද්දි ඒ Photo එකට විස්තරයක් ඇතුල් කරන්න. ඒක කොහෙවත් නොපෙන්නුවට Photo එකත් එක්කම Save වෙනවා. ඔයා ආයෙ Fiverr එකට එය දැමූ විට කොහේවත් නොපෙන්නුවත් ඒ Meta Data එක තියනවා. එතකොට කෙනෙක් search කරද්දි ඔයාගෙ Meta Data එකේ එයා

හොයන වචන තිබ්බොත් ඉක්මනින්ම GIG එක උඩට එනවා. ඒක නිසා ඔයාලා හොඳට හිතලා මිනිස්සු වැඩියෙන් Search කරන Keywords වලින් පොඩි Meta Data එකක් දාලාම Photos Save කරගන්න. පහල රූප වල බලන්න Photoshop මඟින් Meta Data එකතු කරන ආකාරය පෙන්නලා තියෙනවා.







මීළඟට අපේ ගිග් එකක් තුල අපේ පැකේජ සහා එමඟින් ලබාදෙන සේවාව හා මුදල පුරවන්නට එනවා. මෙහිදී පැකේජ 03ක් යටතේ මෙය සිදු කල යුතුයි. මෙයද ඉතාම හොඳින් සකස් කරගත යුතු වෙනවා. අපේ Word Document එකෙහිම මේකත් පුරවගන්න. ඔයා කරන්න බලාපොරොත්තු වන සේවාව අනුව මුදල තීරණය කරන්න. අඩු මුදලකට වැඩි සේවාවක් මුලින් ලබාදී Fiverr තුල ස්ථාවර වීමට බලන්න. වැඩියෙන් වැඩ කරන තරමට ඔයාට මුලින් හොඳ

Rating එකක් එනවා.ඉන් පසුව වැඩ ගලාගෙන එන්න පටන් ගන්නවා. ඔයාගෙ පැකේජ 03ට නම් යොදන විට Silver , Gold , Platinum , Diamond වැනි නම් යොදන්න ඒවා මිනිසුන්ව මනාව ඉක්මනින් ආකෂර්ණය කරගන්නවා. ඔබගේ පැකේජ තුලින් වැඩි යමක් හැම විටම බාර දීමට උත්සාහ කරන්න. පැකේජ යෙදීමෙදි ඔබට Revisions කියලා යමක් පුරවන්නට තියනවා. ඒකෙ තේරුම ඔයා වැඩක් කරලා බාර දුන්නම Customer කිව්වොත් වෙනසක් කරල දෙන්න කියලා කී පාරක් දක්වා මේක වෙනස් කරනවද කියන එක. එතන Unlimited Revisions දෙන්න උත්සාහ කරන්න එවිට ඔයාගෙ ගිග් එක බලන කෙනෙක්ට ඔයාට වැඩියෙන් වැඩ දෙන්න හිතෙනවා නොඅනුමානයි.

ඉන් මේ ටික හරියටම හදාගත්තට පස්සේ ඔයා Fiverr එකේ GIGs කියන Option එකට ගිහින් එතනින් Create New Gig හරහා ඔයාගෙ GIG එක හදාගන්න.පලවෙනි පිටුව සම්පූණර් කරලා දෙවනි කොටසට එන්න Price එකතු කරන්න තියන තැනට. එතනදි ඔයා වැදගත් දෙයක් කරන්න ඕන. ඒක තමයි ආපහු කලින් පිටුවට යන්න. පහල රූප වලින් ඒක මම පෙන්නලා තියනවා. එහෙම ගියාම කලින් ඒ පිටුවේ තිබ්බේ නැති අලුත්ම Option එකක් ඔයාලට පෙනෙයි. ඒ තමයි SEO Title කියලා. මෙන්න මේක Click කරලා ඔයාගෙ සේවාව හැකිතරම් කෙටියෙන් Keywords යොදාගෙන නැවත Type කරන්න. කරලා Save ක්ලික් කරලා ඊළඟ පිටුවට යන්න. අර අපි හදාගත්ත Word Document එකෙන් ගානට අවශ්‍ය තැන් වලට අවශ්‍ය දත්ත ටික දාගෙන පරිස්සමට වැඩේ කරගන්න. කුමක් හෝ ගැටලුවක් මතු වුණහොත් Email මගින් හෝ WhatsApp මගින් අපිට පණිවිඩයක් එවන්න. හැකි උදව්වක් අපි කැමත්තෙන්ම කර දෙන්නෙමු. දැන් ඔන්න GIG එක හදලා Publish කළා. දැන් නිකන් හිටියම වැඩ එයිද? නැහැ එහෙම වෙන්නේ නෑ දැන් තමයි අපි මේ ගිග් එක වෙනුවෙන් යමක් කරන්න ඕනෙ. ගොඩක් අය ඉන්නවා අවුරුද්දක් ගියත් වැඩක් ආවෙ නැති ඒකට හේතුව තමයි එයාලට හරි ගිග් එකක් නොමැති වීම සහා මෙහි මීළඟ පියවර නොකිරීම.

## First Order එක ගන්නේ කොහොමද?

Fiverr හී කෙනෙක්ට අපිට කෙලින්ම වැඩක් බාරදෙන්න පුලුවන් වගේම එයාලට පුලුවන් එයාලගේ වැඩේ විවෘතව පලකරන්න. එතකොට එයාලා එයාලගේ වැඩේට අදාල Tags දානවා. ඒ Tags සහා අපේ Tags ගැලපෙනවා නම් Fiverr හී Buyer Request යන කොටසේ ඒ Orders පෙන්න්නවා. අපිට තියෙන්නේ ඒ Order එකේ විස්තරේ කියවලා ඒකට Request එකක් දාන්න පොඩි විස්තරයක් එක්ක අපිට ඒ වැඩේට ඕන ගාණයි වැඩේට යන කාලයයි වගේ විස්තර ටිකක් පුරවලා. එතකොට ඒ කෙනා එයාට ආව Request ටික බලලා හොඳම කෙනාව නෙවෙයි වඩාත්ම ගැලපෙන කෙනාව බලලා වැඩේ බාර දෙනවා. ඒක නිසා එයාට හොඳට ගැලපෙන්න Buyer Request එකක් දැම්මොත් අපිට ඒ වැඩේ එන්න ඉඩ තියනවා.අලුතෙන් පටන් ගන්න අයට වැඩ හොයාගන්න තියන හොඳම විදිය තමයි මේ Buyer Requests කියන්නේ. ඉතින් මෙහෙම එකක් දාද්දි ඔයාට පොඩි විස්තරයක් ගහන්න එනවා. ඔයා එයාගෙන් වැඩේ ඉල්ලන්න නේ යන්නෙ එතකොට ටිකක් කෙටි වගේ ආකශර්ණය වෙන විස්තරයක් දාන එක ගොඩක් වැදගත්. පිටරර අයට Sir , Mr වගේ වචන කියනවට වඩා මිත්‍රශීලී විදියට Hello There , Hello Bro වගේ කියන එක සෑහෙන්න යෝග්‍යයි. ඒ වගේම තමයි වාක්‍ය 05ට වඩා දාන්න යන්නත් එපා තමන්ගේ Qualifications ගැන කියවන්න යන්නත් එපා. මම පහලින් පොඩි උදාහරණයක් දාන්නම් සරල Buyer Request එකක.

උදා : Hello there , I read your description and I am crystal clear about what you have asked. I am sure you need to have a minimal design with two tone colors for this. I have done some Similar style jobs and I can send you the samples too.

සාමාන්‍යයෙන් දවසට Fiverr හී වැඩ මිලියනයක් එනවා නම් එව්වා වලින් ලක්ශ 9ක් ම කෙලින්ම කෙනෙක්ට ලබාදෙන වැඩ. මිලියනයක් වගේ ප්‍රමාණයක් තමයි ඔය කිව්ව ආකාරයට විවෘතව පල කරන්නෙ. ඉතින් අපි පුලුවන් තරම් උත්සාහ කරන්න ඕනෙ Buyer Request වලට වඩා අපිට Direct Order එකක් ගන්න තත්ත්වෙට එන්න. ඒ වගේම Buyer Request එකකින් වුණත් කෙනෙක් අපිට වැඩක් දෙන්න කලින් අපේ GIG එක බලනවා. එතකොට GIG එකේ විදිය ගොඩක් බලපානවා වගේම GIG Favorite කියලා එකකුත් බලපානවා. ඒ මොකක්ද ඒ? ඇත්තටම ඕන කෙනෙක්ට අපේ GIGS View කරන්න පුලුවන්නේ. ඉතින් කෙනෙක්ට අපෙන් වැඩක් ගත්තේ නැතත් අපේ වැඩ ලස්සනයි වගේ නම් පොඩි Heart එකක් දාන් යන්න පුලුවන් අර Facebook එකේ Like එකක් වගේ. ඉතින් අපිට

හොඳට Favorites ටිකක් එකතු කරගන්න පුලුවන් නම් අපේ GIG එකට අපිට වැඩක් බාර දෙන්න එන අයගේ ඔලුවේ හොඳ හැඟීමක් ඇති කරවන්න පුලුවන්. ඒ වගේම තමයි හොඳට Favorites තියන ගොඩක් අය බලන GIGs Fiverr එකෙන්ම ටිකක් උඩට දාලා දෙනවා. එහෙනම් දැන් කොහොමද අපේ GIG එකට මෙව්වා කරගන්නේ.

ඒ විදිය තමයි Favorite Exchange කියලා කියන්නේ. අපි වගේ Fiverr කරන ලක්ශ ගානක් අය එකට ඉන්න Facebook Groups තියනවා. ඔයාලා Facebook එකේ Fiverr Gig Favorite Exchange කියලා ගැහුවා නම් ඕන තරම් ඒ වගේ Group බලාගන්න පුලුවන් වෙනවා. ඉතින් මේවායේ ගිහින් තමන්ගේ Fiverr GIG එකෙ Link එක පෝස්ට් එකක් විදියට දාන්න. එතකොට ඒකේ ඉන්න අය ඔයාට එයාලගේ GIG Links දෙයි. ඔයා එව්වට Favorite එකක් දැම්මම එයාලා ඔයාගෙ එකටත් එකක් දායි. ඉතින් මේ විදියට ඔයාගෙ GIG එකට හොඳ Favorite ගාණක් ආවම නිකන්ම පලවෙනි වැඩේ ඔයාට ලැබෙයි මාසයක් යන්නත් කලින්. ඒක හොඳට කරගත්තොත් අනිවාර්යෙන්ම ඔයාට දිගටම වැඩ එන්න ගනී.

## Fiverr එකේ වැඩ කරාම කොහොමද සල්ලි ගේන්න ගන්නේ?

මේක නම් ගොඩක්ම ලේසි සහා සරල දෙයක්. Fiverr එකෙන් ඔයාට පුලුවන් කෙලින්ම ඔයාගෙ බැංකුවට කිසිම කරදරයක් නැතුව සල්ලි ගේන්න ගන්න. විදි කිහිපයක් තියෙනවා. මම ඒ අතරින් වඩාත්ම පහසු සහා ලේසි විදිය කියලා දෙන්නම්. අන්තජර්ාලයෙන් මුදල් ගනුදෙනු කරන්න Payoneer නම් වූ වෙබ් අඩවියක් තියනවා. ඒකෙ ඉතා පහසුවෙන් ගිණුමක් සකස් කරලා ඒකට ඔබ ලංකාවේ භාවිතා කරන බැංකු ගිණුම එකතු කරන්න. ඊට පස්සේ Fiverr ඒකෙන් ඔයාට එකතු වෙන ගාණ කෙලින්ම ඔයාගෙ Payoneer ගිණුමට එකතු කරගන්න පුලුවන්. සැලකිය යුතු මුදලක් Payoneer එකේ එකතු කරගෙන ඒක කෙලින්ම ඔයාගෙ බැංකුවට එක බටන් එකක් ක්ලික් කරලා ඔයාට පහසුවෙන්ම ගෙන්වා ගැනීමේ හැකියාවක් තියනවා. මේ ක්‍රමයට අකමැති කෙනෙක්ට PayPal හරහා වුණත් ඔයාගෙ මුදල් ලංකාවට ගේන්න පුලුවන්.




උඩ කිව්වා වගේ ...දැන් අපි හිතමුකෝ කොහොමහරි සල්ලි හෙව්වා කියල .කොහොමද සල්ලි WITHDRAWN කරන්නෙ.ඒකට ඔයාල යන්න ඕනෙ EARNINGS කියන කොටසට.ඒකෙ AVAILABLE FOR WITHDRAWN විදිහට තියෙන AMOUNT එක ඔයාට WITHDRAWN කරන්න පුළුවන්. ඔයාට එතන ක්රම 3 ක තියෙනවා සල්ලි WITHDRAWN කරන්න පුළුවන් .

PAYPAL ACCOUNT -ඔයාට පුළුවන් ඔයාගෙ PAYPAL ACCOUNT එක FIVERR එකට LINKS කරල සල්ලි WITHDRAW කරන්න.ඒකට ඔයාට PAYPAL ACCOUNT එකක් තියෙන්නේ ඕන

BANK TRANSFER

FIVERR REVENUE CARD- FIVERR REVENUE CARD එක කියන්න PAYONEER CARD එකටම තමයි. ඔබට දැනට CARD එකක් නැත්නම් FIVERR එකෙන් අලුත්ම CARD එකක් APPLY කරන්න පුළුවනි.

---




මේකෙන් වෙන්නෙ ඔයාට කරන්න බැරි ODER එකක් ආවොත් නැත්නම් වෙලාවට ODER එක දෙන්න බැරිනම් ඔයාට BUYER එක්ක කතා කරල ODER එක CANCEL කරන්න දීල තියෙන OPTION එකක් .

හරි ඊළගට FIVERR එකේ TIPS & වැදගත් කාරනා ඊළග පිටු ටිකෙන් බලාගන්න>>>>>>>>

## 06 2020 Tricks & tips

ගොඩක් අය විශ්වාස කරන විදියට ෆයිවර් එකේ සාර්ථක වෙන්න වාසනාව ඕනෙ. හැබැයි ඒක ඇත්තටම බොරුවක්. වාසනාවත් ටිකක් ඔනෙ තමා. ඒ වගේම ඕඩර් ගන්න නම් ගොඩක් මහන්සි වෙන්නත් ඕනෙ. 90% දෙනා කරන්නෙ කොහොමහරි එයාලගෙ Skills දාලා ගිග් එකක් හදන් දවස් දෙක තුනින් ඕඩර් එන් නෑ කියලා වැඩේ අතාරිනවා. මේක කියවව ඔයත් සමහරවිට එහෙම වෙන්න ඇති. එහෙම කරපු කෙනෙක් නම් දැන්ම ඔයාගේ පරණ ගිග් එක අයින් කරලා මේ මම කිය මේ අලුත් දේවල් ටික කරලා බලන්නකෝ. මට ලොකු විශ්වාසයක් තියෙනවා බාගෙට බාගයක් දෙනාට ගේමක් ගහන්න පුලුවන් වෙයි කියලා,

Buyer කෙනෙක් එයාලගෙ වැඩකට SELLER කෙනෙක් තෝරද්දි මුලින්ම එයාලා කරන්නේ Fiverr එකේ එයාලගෙ

වැඩේට අදාල SEARCH TERM එකක් දාලා SEARCH කරන එක. එතකොට එයාලගෙ වැඩේට අදාල SELLERS ලා LIST එක පෙන්නුම් කරනවා. මේ ලිස්ට් එකේ ඊට පස්සෙ එයා එක එක සෙලර් ලගෙ ගිග් එකට ගිහින් බලනවා එයාගෙ වැඩේට හරියන කෙනා කවුද කියලා. මෙහෙම දෙතුන් දෙනෙක් තෝරාගෙන බලලා ඒ අයට PERSONAL MESSAGES දානවා. මෙතනින් පස්සෙ BUYER AND SELLER අතර අදාල සන්නිවේදනය වුනාට පස්සෙ BUYER තීරණය කරනවා මම මෙයාට ඕඩර් එක දෙනවද නැත්ද කියලා. මෙහෙම ගොඩක් වෙලාවට BUYER කෙනෙක් තෝරාගැනීම් කරන්නේ එයා SEARCH LIST එකේ පළමු පිටුව එහෙමත් නැතිනම් උපරිම දෙවන පිටුවෙන්. එතනදි BUYER කෙනෙක් ගොඩක්ම සලකලා බලන තවත් දෙයක් තමා එයාලගෙ කලින් වැඩ කොහොමද හා ඒවගෙ REVIEWS කොහොමද කියලා. මේ

ඔක්කොම සාධක SELLER කෙනෙක්ට ඕඩර් එකක් ලැබෙන්න ගොඩක්ම බලපානවා. දැන් ඔයාලට මම මේ වැඩ ටික කියලා දෙන්නේ මෙන්න මේ FIVERR SEARCH LIST එකේ පළමු පිටුවේ ඔයාගේ ගිග් එක පෙන්නුම් කිරීමට අදාල වැදගත් දේවල් ටිකක්. ඔයාලට තේරෙන්න ඇති ඕඩර් ලැබෙන්න ඒක කොච්චර වැදගත් වෙනවද කියලා.

## 1 GET YOUR FIRST ORDER ASAP

මෙතන්දි ඔයා කරන්නේ ඔයාගේ යහලුවෙක්ට කියලා FAKE ORDER එකක් දාගන්න එක. මේක ඔයාගෙ යාලුවට අදාල ඩොලර් ගාන දිලා ඔයාට කරගන්න ලේසියෙන්ම පුලුවන් දෙයක්. නමුත් මේක FIVERR TERMS AND CONDITION වලට විරුද්ධ දෙයක් කියලා මතක තියාගන්න. ඒ නිසා මේ වැඩේ ඔනෑවට වඩා කරගන්න යන්න එපා හැබැයි ඔයාව BAN

වෙන්න පුලුවන්. ඔයාගෙ යාලුවට කියන්න ඕඩරේ හරියට කලාට පස්සෙ හොද REVIEW එකක් දෙන්න කියලා. මොකද මෙ REVIEW මත තමා ඔයා SEARCH LIST එකේ උඩට එන්නෙත් ඉස්සරහට ඕඩර් ලැබෙනවද කියලාත් තීරණය වෙන්නෙ. පළමු ඕඩර් එකෙන් පස්සෙත් වෙන අයගෙන් ඕඩර් එන් නැතිනම් ටික කාලයක් ඉදලා තව ඕඩර් එකක් වෙන යාලුවෙක්ගෙන් ඉල්ලගෙන ඒකෙනුත් හොදම 5 STAR RATING එක්ක REVIEW එකක් ඉල්ල ගන්න. හැබැයි පුතාලා මේ වැඩේ ඕනෑවට වඩා එපා. කීවනෙ මොකද වෙන්නෙ කියලා. ඒ නිසා ආයෙ අයෙ නොකර ඉන්න එක ඇගට ගුණයි. මේ වැඩේ හරියන් නැතිනම් ඔයා ඊලගට කරන්න ඕනෙ වැඩේ තමා හැමදාම BUYER REQUEST දාන එක. ඒක තමා දිනපතා කරන්න ඕනෙ වැදගත්ම වැඩේ ඔයාලා. මම මෙ FAKE ORDER වැඩේ මුලින්ම කීවත් මීට කලින් ඔයා හොද

Research එකක් එක්ක කරන්න ඕනේ වෙනත් වැඩ ටිකක් තියෙනවා. මේක කරන්න ඕනේ හැබැයි ඒ ටික හරියටම ඉවර කරලා. එහෙනම් ඊලගට කියන්න යන්නේ ඒ වැඩ ටික ඔන්න. මතක ඇතුව මරිසි ගේම් ගහන අයනම් FIVERR TERMS AND CONDITION කියවලා බලන්න හොදේ. මේ වැරදි වැඩනම් මම අනුමත කරන් නෑ. ඒත් ඉතින් ගොඩයන්නත් ඕනෙනෙ අපේ අය.......

## 2 On Page SEO for your Gig

ම්ම්ම්....මේකනම් ෆයිවර් කරන 95% දෙනා නොදන්න සහ නොකරන දෙයක්. ඔයාලා දැන් බලනවා ඇති මොකක්ද මේ SEO කියන්නේ කියලා. ඔයා මේ ගැන කිසිවක්ම නොදන්න කෙනෙක් නම් පහලින් පිටු දෙක නිවාර්යයෙන්ම කියවන්න. මේකෙන් ඔයා මේ Search Engine Optimization ගැන සාමාන්‍ය

අවබෝධයක් ලැබේවි.

## SEO යනු කුමක්ද?

ඔබේ වෙබ් අඩවිය ON-PAGE SEO කරන ආකාරය

ඉතින් මෙන්න මේ වෙබ් අඩවියකට අදාලව කරන SEO මූලික සිද්ධාන්ත තමා අපි අපේ FIVER GIG එක SEO කරන්න යද්දිත් යොදා ගන්නේ.

ආ....තව වැදගත්ම දෙයක් KEYWORD RESEARCH එකක් කරන ආකාරය ගැන ලියූ පිටුව. ඒකත් ඔයාලා මෙතනදී අනිවාර්යයෙන්ම කියවන්න ඕනෙ . මොකද ඉස්සරහට අපි යොදාගන්න SEARCH TERMS එහෙමත් නැතිනම් KEYWORD වලට තමා ඔයාගෙ ෆයිවර් ගිග් එක SEO කරන්නේ. ඒ නිසා මේ ගැන නොතේරෙන අය ඉන්නවනම් PAGE අනිවා කියවන්න. මෙතනදි අපි KEYWORDS එහෙමත් SEARCH TERMS විදියට සලකන්නේ BUYER කෙනෙක්ට ඔයාගේ ගිග් එක පෙන්නුම් කිරීමට සදහා ඔහු FIVERR වල

SEARCH කරන වචනයි. සරලවම කීවොත් මොනවගේ දේවල් SEARCH කරන අයටද ඔයාගෙ ගිග් එක පෙන්නුම් කරන්න ඕනෙ කියල. මෙ ගැන සලකා බලලා ඔයාට පුලුවන් මේ වගේ KEYWORD LIST එකක්ම හදාගන්න.
මේ ගැන තවත් පැහැදිලි කරොත් ඔයාලා දන්නවනෙ LOGO DESIGN කියලා අපි FIVERR එකේ SEARCH කරන්න යද්දි ඒ ගමන්ම තවත් SEARCH TERMS සෙට් පහලින් AUTO SUGGEST වෙනවා. ඒ තමා LOGO DESIGN වලටම සම්බන්ධව වෙනත් අය බහුලවම සොයන වචන. ඔයා LOGO DESIGN කරන කෙනෙක් නම් මේ සියලුම වචන තමා ඔයාගෙ ගිග් එක පෙන්නුම් කිරීමට අදාල ඒවා විදියට ඔයා ඔයාගෙ KEYWORD LIST එකට ඇතුලත් ඕනෙ ඒවා. මේ වගෙ වචන LIST එකක් මුලින් අපි හදාග මු. මෙ තැනට ගෙන එන්න පුලුවන් ඒවා තෝරාගෙන ඒවට අදාලව තමා අපි ගිග් එක SEO කරන්නෙ.

ඔයා දැන් මුලින් හදාගත්ත KEYWORD LIST එකට අදාලව වෙන වෙනම ANALYSE එකක් කරල බලන්න ඕනෙ. එතනදි ඔයාට බලාගන්න පුලුවන් වෙයි මොනවගේ SELLERS ලද අදාල SEARCH TERM වලට මුල්ම පිටුවේ ඉන්නෙ කියලා. ඒ ගිග් වල එයාලා මොනවද දාලා තියෙනනෙ හා ඒවා ඔයාගෙ ගිග් එක හදද්දිත් වැදගත් වේවි. ඒ වගේම මේ ඔයාගෙ ෆීල්ඩ් එකේම අයගෙ ගිග් වල යටටම ගිහින් බැලුවොත් ඔයාට හඳුනාගන්න පුලුවන් වෙයි මෙයාලා මොනවගේ TAGS ද යොදාගෙන තියෙන්නේ කියලත්. මේකෙන්ම ඔයාගෙ KEYWORD LIST එකට අනිවා තව තවත් අදහස් ලැබේවි.
SEARCH කරන KEYWORDS වලට අදාලව මුල් තැන් අරන් ඉන්නෙ TOP RATED SELLERS එහෙමත් නැතිනම් LEVEL TWO SELLERS ලා නම් ඔයාගෙ තරගෙ අමාරු වෙනවා. මෙතනදි

තර්ගකාරීත්වය අඩුම KEYWORDS 5ක් අපි මුලින් තෝරාගන්නා ඕනෙ. ඒ 5 නුත් අපි හොදම තත්වයට ගේන්න පුලුවන් KEYWORD එකට අදාලව තමා අපේ ගිග් එකේ හැම දෙයක්ම කරන්නේ.
මම මෙතනදි එක් ප්රධාන TAG එකක් අරන් ඒ සදහා ඔයාගෙ ගිග් එක සකස් කරන ආකාරය ගැන කියල දෙන්නම්. මගේ ප්රධාන ටැග් එක තමයි: 'SOCIAL MEDIA COVER DESIGN'
ADD KEYWORD INTO TITLE

දැන් උඩින් කීව ටැග් එක එහෙමත් නැතිනම් කීවර්ඩ් එකට අදාලව ඔයාගෙ ගිග් TITLE එක මෙන්න මේ විදිහට තමා සැකසෙන්න ඕන; 'I WILL DO SOCIAL MEDIA COVER DESIGN FOR YOU FOR 10$'
ඔයාට පේනව ඇති TITLE එකේ අදාල වචනය අන්තර්ගත කරලා තියෙන විදිය. මේ විදියටම ඕනෙ නෑ. අනිවාරයෙයෙන්ම

වෙන්න ඕනෙ දේ තමා ඔයාගෙ වැඩේට අදාල ප්‍රධාන වචනය අදාල ටයිට්ල් එක තුළ අන්තර්ගත කිරීම. හැබැයි මතක තියාගන්න ඔයාගෙ TITLE එක ඉතාම ආකර්ෂණීය එකක් කර ගැනීම ඉතා වැදගත් කියලා. මේක මත තමා තීරණය වෙන්නෙ CLIENT කෙනෙක් ඔයාගෙ GIG වෙත යනවද නැතිද කියලා,

ADD KEYWORD TO DESCRIPTion

ඔයාට ෆයිවර් එකේ ගොඩක් ලොකු සාර්ථකත්වයක් ලබන්න නම් හොද DESCRIPTION එකක් සකසා ගැනීම ඉතා වැදගත්. එතනදි ඔයාගෙ වැඩේ ගැන සම්පූර්ණ කෙටි සංක්ෂිප්තයක් ඉදිරිපත් කරන්න වෙනවා. මේක ආකර්ෂණීය වීම මත තමා ඔයාගෙ CLIENT කෙනෙක්ට ඔයාව HIRE කරන්න හෝ නොකරන්න සිතෙන්නේ. හොද DESCRIPTION එකක් එක්කම ඔයා කරන්න ඕනෙ දෙයක් තමා ඔයාගෙ ප්‍රධාන KEYWORD එක හා අනෙක් KEYWORD මේක අස්සට බස්සන

එක. මේක ඉතා සූක්ෂමව කරන්න ඕනෙ DESCRIPTION එකේ QUALITY එකට හානියක් නොවෙන විදියට. අපි අර කලින් ගත්ත SOCIAL MEDIA COVER DESIGN කියන වචනය මේක අස්සට බස්සනව නම් කරන්න ඕනෙ DESCRIPTION එකේ මුල්ම වාක්‍ය කීපයේ, නැවත මැද හරියේ හා අවසාන හරියේ මේ වචනය අන්තර්ගත කරන එක. වැඩිය දාන්න ගියොත් හැමදේම අවුල් වෙන්න පුලුවන්. ඒ නිසා මේ වැඩේ කල්පනාකාරිව කරන්න ඕනෙ. හැබැයි කිසිමවෙලාවක තුන් වතාවකට වඩා ඇතුල් කරන්න කරන්න එපා. ඒක හානිදායකයි කියාවත් මතක තියාගන්න.

## ADD RIGHT KEYWORDS TO TAGS

ඔන්න මම කලින් කිව්ව නේද KEYWORD LIST එකක් හදාගෙන ඒවගෙන් හොදම 5ක් තෝරාගන්න කියලා,

5 අන්තර්ගත කරන්න පුලුවන්. අන්න ඒකයි මම ඒ ගැන හොදට හොයලා බලන්න කීවේ. TAGS 5 කට වඩා ඇතුළත් කරන්න බැරි බවත් මතක තියාගන්න. TAGS වලින් තමා ඔයාව CLIENT ලට නිරාවරණය වීම වෙන්නෙ.

## KEYWORD ALSO APPEAR IN THE URL

ඔයාගෙ ගිග් එකේ URL එක සැකසීම තීරණය වෙන්නෙ ඔයාගෙ TITLE එකට අදාලවයි. ඔයා ඔයාගෙ TITLE එක නිවැරදිව ඇතුලත් කලොත් මෙන්න මේ URL එක සැකසෙන්නෙ ඒ සදහා යොදාගත්තු වචන අනුසාරයෙන්. දැන් අපි SOCIAL MEDIA COVER DESIGN කියන එක මේ ටයිට්ල් එකට දාපු නිසා ගිග් URL එකේ ඒ වචනයත් අනිවා අන්තරගත වීම AUTOMATICALLY වෙනවා. මෙකත් ඔයාගෙ ගිග් එක අදාල KEYWORD එකෙන් ඉහලින්ම

පෙන්නුම් කරන්න ලොකු බලපෑමක් කරන දෙයක්.

## Image Optimization with Keywords

ඔයාලට පුලුවන් ගිග් වලට අදාලව Images එකතු කරන විට ඒවයේ නම් වලට අපි ඉහතදි තෝරගත්තු Keywords ඇතුලත් කරන්න. මෙක හැබැයි කරන්න කරන්නේද Computer එකෙන් අදාල PICTURES සකසා ගන්න කොටමයි. හැබැයි Image Names ගොඩක් දිගට ඇතුලත් කරන්න යන්න එපා. වචන 3-4 ක් උපරිම ඇති. මේකත් GIG SEO වලදී වැදගත් වෙන සුපිරිම tip එකක්.

## 3 Make Trustworthy clients

උඩින් මම කියපු වැඩ ටික හරියට වුනානම දැන් ඔයාට 70% විතර චාන්ස් එකක් තියෙනවා ඕඩර් එකක් ලැබීමට. ඒකට හේතුව තමයි, Fake order හරියට

කරලා තියෙන නිසා 5 STAR RATINGS වගේම හොද POSTIVE REVIEW ඔයාට තිබීමත් GIG එකට අදාල TITLE, DESCRIPTION, TAGS වගේ දේවල් හරියටම තිබීම. මේ කිසිවක් නොකර BUYER REQUEST දිනපතා බලලා හරියටම දානවනම් ඕඩර් 2-3ක් වත් අනිවා සෙට් කරගන්න පුලුවන්. ඕඩර් සෙට් වුනාට වැඩක් නෑ ඔයා ඒවා හරියට කලේ නැතිවුනොත්. හදිසියේ වත් ඔයාගෙ වැඩේ ගැන CLIENT සතුටු නොවී NEGATIVE FEEDBACK එකක් එහෙම දුන්නොත් ඔයාට ආයෙ ලේසියෙන් නම් FIVERR FIRST PAGE එකට තියා ඕඩර් එකක් වත් නම් ආයෙ ගන්න ලැබෙන්නෙ නෑ. මේ නිසා ලැබෙන වැඩේ CLIENT එක්ක හොදට කතා කරලා ගානට වෙලාවට හොදට කරන්න ඕනෙ.

එයාට ඔයගෙ වැඩේ ගැන SATIS වෙලා 5 STAR RATING එක්ක හොද REVIEW

එකක් ආවා කියන්නේ ඔයාග වැඩේ හරි.එක ඕඩර් දෙන්න බලපානවා වගේම Fiverr rank එක උඩට යන්නත් ලොකුවටම බලපානවා. මේ වගේ නැවත නැවත ඕඩර් ඔයාටම දෙන විශ්වාසවන්ත client ලා සිටීම ඔයාගෙ ගිග් එක අර කීව Keyword වල උඩට එන්න අනිවා බලපානවා. ඒ නිසා ආයෙත් කියන්නේ ලැබෙන වැඩේ උපරිම හොදට කරන්න.

## 4 Increase your conversion raTe

සාමාන්‍යයෙන් buyer කෙනෙක් එහෙමත් නැත්නම් client කෙනක් ඕඩර් එකක් දෙන්න කලින් එයා seller ලා කීප දෙනක් එක්කම කතා කරනවා. එහෙම කතා කරලා වැඩේ ගැන උපරිම සාධාරණයක් කරයි කියලා සිතන seller කෙනෙක්ට තමා එයා ඕඩර් එකක් දෙන්නේ. මෙතනදි seller කෙනෙක්ගේ conversion rate එක කියන්නේ එයා එක්ක කොපමණ buyer ලා ප්‍රමාණයක් Message කලාද එයින් කී දෙනෙක් ඕඩර් එයාට දුන්නද කියන එක. අපි හිතමු ඔයාට buyer ලා 10 දෙනක්

message කරලා ඒකෙන් එකම එක්කෙනෙක් ඕඩර් එකක් දුන්න කියලා, එහෙනම් ඔයාගෙ conversion rate = 10%. මෙන්න මේ conversion rate එක වැඩිවෙන්න වැඩිවෙන්න තමා ඔයාගෙ ගිග් අර කීව keyword වලින් උඩට එන්නෙ. ඒ නිසා ඔයාට message කරන buyer ලත් එක්ක සන්නිවේදනය උපරිමෙ කරගෙන ඉන්න වෙනවා වගේම ඕඩර් එක දෙන විදයටම කතා කරගන්න වෙනවා.

5 Stay online

සාමාන්යයෙන් client කෙනෙක් එයාගෙ වැඩේ පුලුවන් ඉක්මනටම කරගන්න තමා බලන්නෙ. එතනදි ගොඩක් buyers ලා Fiverr search කරන ගමන්ම අදාල වැඩේට අදාලව Active sellers ලා කවුද ඉන්නෙ කියලත් බොහෝවිට සොයා බලනවා. මේ නිසා ගොඩක් Active එහෙමත් නැතිනම් Online ඉන්න seller කෙනෙක්ට පොඩි වාසියක් අත්වෙනවා. ඒ වගේම බයර් කෙනෙක් හරිම කැමතියි seller කෙනෙක් වැඩේට අදාලව ඉක්මනින්

reply කරනවනම්. ඔයාල පුලුවන් තරම් Fiverr Active වෙලා ඉන්න. ඔයාට පුලුවන් Fiverr mobile app එක ඔයාගෙ ස්මාර්ට් දූරකථනයේ Install කරගන ඔයා ලැප් එකකින් හරි කොම්පියුටර් එකක් හරහා අන්තර්ජාලයට සම්බන්ධ වෙනවා නම් වෙබ් බ්රවුසරේ එක ටැබ් එකක හැමවෙලවෙම Fiverr.com වලට ලොග් වෙලාම යන්න. මේ විදියට Online ඉන්න එකත් Fiverr search rank එකට බලපානවා.

## 6 Become a higher level seller

සාමාන්යයෙන් අපි හැමෝම දන්නවා Level one seller, Level two seller වගේ තත්වෙකට ආවම අනෙක් අලුත් සෙලර් කෙනෙක්ට වඩා එයාලට ඕඩර් එනවනෙ කියන කතාව ඒකට ප්රධනතම හේතුව එයාලා Fiver search result එකේ උඩම එහෙමත නැතිනම් පළමු පිටුවේ සිටීම. මේ හේතුව තමා එයාට ඕඩර් එන්න ලොකුවටම බලපාන්නේ. ඔයාලත් එන ඕඩර ් හරියට කරගෙන හොද රිවීව්

එකකුත් එක්ක Level 1, 2 ආවොත් එතනින් එහාට ගමන අතිශය කාර්යබහුලයි. ඕඩර් එන්න ගන්නවා කරගන්න බැරි තරමට. ඒ වගේම මෙහෙම level up වීම අර කීව Keyword වලට ඔයාගෙ රෑන්ක් උඩටම අරන් එන්න සමත් වෙනවා. ඔයා කලින් අපි කීව gig seo part එක හරියටම කලොත් අදාල search result එකේ 1,2,3 යන ස්ථානවල ඉන්නවා නියතයි. මෙහෙම level up වෙන්න ඉතින් ටිකක් කට්ට කන්නම වෙනා. කාලයක් යනකන් ඉවසන් ඉනනත් ඕනෙ. ඒ නිසා වැඩේ බාගෙට කරලා නවත්වන්න එපා. ඒ වගේම මෙහෙම Level up වුණු ගමන්ම එක පාර ඕඩර් වල අඩුවක් වෙනවා. ඒකේ ඇත්ත තේරුම නම් මම දන්නේ නැහැ. සාමාන්‍යයෙන් level one seller කෙනෙක් වෙන්න ඔයා අවම ඩොලර් 400ක් උපයන්න ඕනෙ.

level two seller කෙනෙක් වෙන්න ඩොලර 2000ක මුදලක් උපයන්නත් වෙනවා.

## 7 Promote Your Gigs in Social media

කෙටියෙන් කීවොත් ඔයාට පුලුවන් ඔයාගෙ ගිග්ස් Facebook, twitter, linkedin, instagram හා pinterest වල promote කරගන්න. මෙතනදී ඔයාගෙ Link එක හල හල යන්න එපා. මොකද ඒකෙන් ඔයා බ්ලොක් වෙන්න පුලුවන්. ඔයා මෙතන්දි බලන්න ඕනෙ ඔයාගෙ buyers ලා වෙන්න පුලුවන් අය මොන social media වල මොනවගේ තැන්වලද ඉන්නෙ කියලා. මේ ගැන තවත් පැහැදිලි කරලා කීවොත්, අපි හිතමු ඔයා seo services sell කරන කෙනෙක් කියලා. එතකොට ඔයාගෙ service එක ඕනෙ වෙනවා වෙබ් අඩවි හිමිකරුවන් හා වෙබ් ඩිසයින් ගැන උනන්දු අයට. ඉතින් ඔයාට පුලුවන් Web design and development වලට උනන්දු අය ඉන්න Facebook Groups වලට සම්බන්ධ වෙලා ඒවයේ ඉන්න අය එක්ක engage වෙලා හෙමින් සැරේ ඔයාගෙ Gig එක ගැන විස්තරයක් දාන්න.

මෙතනින් ඔයාට පුලුවන් වෙයි හරියටම Targeted customers ලා පිරිසක් ඔයාගෙ ගිග් එකට ගෙන්න ගන්නත්. මේ අයගෙන් හදිසිය හරි එකෙනෙක් හරි ඔයාව ඕඩර කලොත් ඉතින් ආයේ කතා ඕනෙ නෑනෙ. ඔයා ගොඩ....... Facebook විතරක්ම නෙමේ අනෙක් සමාජ ජාල වල වෙබ් අඩවිත් එක එක niche වලට වෙන වෙනම ගැලපෙනවා.
හැමවෙලේම ඔයා buyer කෙනෙක් හිතන විදියට හිතලා බලන්න. ඊට පස්සෙ ඒ ගැලපෙන buyer ලා හොයාගන්න තමා ඔයා මේ සමාජ ජාල භාවිතා කරන්න ඕනෙ. නිකන් ඔයාගෙ brand එකට facebook page, facebook group, linkedin profile, twitter account, instagram profile එකක් හදාගෙන හිටපු පලියටනම් වැඩක් නැහැ. දැන් බලමු ඔයාගෙ Fiverr gig ranking එකට කොහොමද මේ social media වල promote කරන එක බලපාන්නේ කියලා,
ඔයා gig එක වෙන social media වල share කරගන්න කොට automatically fiverr එකට ඒවායෙන් සෙනග ගලා

එනවා. එතකොට වෙන්නේ එයාලගෙ වෙබ් අඩවියට තවත් මිනිස්සු ගලාගෙන ඒම හරහා එයාලගෙ business එක නොමිලේ promote වෙන එක. එතකොට එයාලගෙ වෙබ් අඩවියේ alexa rank එක ගොඩක් අඩු වෙනවා. ඒක එයාලට ලොකු වාසියක්. තව කීවොත් මේ social media අලුත් කේනෙක් ඇවිල්ල ඉන්න ඕනෙම seller කෙනෙක්ට ගානක් ගෙවලා service එකක් ගත්තා කියලා. මේ හැම ඕඩරේකින්ම 20% එයාලගෙ account වලට යන නිසා සමාගමේ ආදායමත් එන්න එන්න වැඩි වෙනවා. මේ නිසයි ෆයිවර් එක කැමති ඔයාල Gig promote කරන්න සමාජ ජාල යොදාගන්නවට. මේ විදියට කරන අයගෙ rankings අපි අර කතා කරපු keywords වල උඩට එන්න බලපානවා.එ නිසා ඔයාලා ගිග් එක නිවැරදිව හදල ඉවර වුනාම ඒවා මම අර කීව විදියට හිතලා සමාජ ජාලවලට බෙදගෙන ගේමක් සෙට් කරගන්න.

(වෙනත් වැදගත් කරුණු)

• ඔබට ෆයිවර් වල සෑදීමට පුලුවන හිතවත් ඕඩර් දෙන්න බලපානවා වගේම FIVERR SEARCH RANK එක උඩට යන්නත් ලොකුවටම බලපානවා. මේ වගේ නැවත නැවත ඕඩර් ඔයාටම දෙන විශ්වාසවන්ත CLIENT ලා සිටීම ඔයාගෙ ගිග් එක අර කීව KEYWORD වල උඩට එන්න අනිවා බලපානවා. ඒ නිසා ආයෙත් කියන්නේ වැඩේ උපරිම හොදට කරන්න.
ඔබට ෆයිවර් වල සෑදීමට පුලුවන් ගිග් හතම එකම CATEGORY එකක් තුළ සෑදීම කරන්න. මෙහෙම කලාම ඔබ ඒ CATEGORY එක තුළම ගොඩක්ම නිරාවරණය වීම සිදුවෙනවා විතරක් නෙමේ ගිග් වලින් එකකට හරි ඕඩර් එන්න චාන්ස් එකක් නිර්මාණය වෙනවා.

එක ලග යන ගිග් සෙට් එකක්ම හදාගන්න

එක අපේ ප්‍රධාන මාතෘකාවෙ කතා කරපු SEARCH terms වල ඉහලට එනවා කියලත් • අනෙක් වැදගත්ම දේ තමා GIG TITLE, GIG IMAGES වගේ ඒවා ආයෙ වෙනස් කරන්න එපා කියන එක. මොකද ඒක අපේ GIG RANKING වලට කෙලවෙන දෙයක්. මොකද ඔයා TITLE වෙනස් කලත් GIG URL එක වෙනස් වෙන්නේ නැහැ. ඒ නිසා URL තියෙන්නෙ මුලින්ම දීපු ටයිටල් එකට නිසා ඒක ඔයාගෙ රැන්කින් වලට අශුභවාදීව තමා බලපාන්නේ. IMAGE වලටත් මේක NEGATIVE විදියට තමා බලපාන්නෙ. ඒ නිසා මුලින් දීපු TITLE, IMAGE වෙනස් කරන්න එපා. TAGS, DESCRIPTION නම් ඔයාට පස්සෙ වෙනස් කරගන්න පුලුවන්. ඔයා තෝරගත්තු TAGS වලට අදාලව RANKING වල වෙනසක් පේන්න නැතිනම් වෙන TAGS ටිකක් දාලා ඒවාට අදාලව DESCRIPTION එක වෙනස් කරගන්න. මමනම් කියන්නේ මෙහෙම

ආය වෙනස් කරනවට වඩා GIG එක DELETE කරල අලුතින් TITLE. DESCRIPTION. TAGS එක්ක අලුත් GIG එකක් හදන එක හොදයි කියල. වැදගත්>>>

> අලුත් දෙයක් කරන්න බලන්න හැමතිස්සේම මේක ODER එන්න ලොකු බලපෑමක් කරනවා.

> ඉක්මනින් ODERS DELIVER කරන්න,එන ක්ෂණයෙන් MESSAGE වලට REPLY කරන්න.

> ODER එකක් සාර්ථක කර ගන්න වගේම තව ODERS ගන්නත් BUYER එක්ක සුහදව කතා කරන එක වැදගත්.

> කොයි වෙලාවකවත් BUYER ගෙන් DIRECT CONTACT DETAILS (Facebook.e-mail.Skype) ඉල්ලන්න එපා මොකද FIVERR එකෙන් BANNED කරනවා.

> හැකි සෑම විට ONLINE ඉන්න ORDERS එන්න වැඩි සම්බාවිතාවක් තියෙනවා.